Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# ඉතිහාසය

08 ශ්‍රේණිය — කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ශ්‍රී ලංකාවේ මහ වැව් තැනවීමේ ආරම්භක පාලකයා වන්නේ මින් කුමන රජතුමා ද?

(i) මහසෙන් (ii) වසභ
(iii) දේවානම්පියතිස්ස (iv) ධාතුසේන

02 පුනරුද සමයේ ජොහැන්නස් ගුටෙන්බර්ග් විසින් නිපදවන ලද්දේ මින් කුමක් ද?

(i) මුද්‍රණ යන්ත්‍රය (ii) දුරකථනය (iii) වාෂ්ප එන්ජිම (iv) දුවන නඩාව

03 යුරෝපීයයන් මුහුදු මගින් භාණ්ඩ ගෙන යාමේ දී හමුවන ගොඩබිම් මාර්ගවලදී භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිතා කළේ මින් කුමන භාණ්ඩ ප්‍රවාහන ක්‍රමය ද?

(i) කරත්ත (ii) බයිසිකලය (iii) තවලම (iv) අශ්වයින්

04 පෘතුගීසින්ගේ මව්රට වන පෘතුගාලය අයත්වන අර්ධද්වීපය වන්නේ මින් කුමක් ද?

(i) මලය (ii) කොරියානු (iii) ඉන්දියන් (iv) අයිබීරියන්

05 වර්ෂ 1521 දී සිදු වූ විජයබා කොල්ලයට සම්බන්ධ රජතුමා වන්නේ මින් කවරෙක්ද?

(i) ශ්‍රී විජය රාජසිංහ (ii) පළමුවන විජයබාහු
(iii) හයවන විජයබාහු (iv) සේනා සම්මත වික්‍රමබාහු

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 කූටකණ්ණතිස්ස රජු පද්මස්වර නමින් උයනක් තැනවීය. ( )

07 කොනප්පු බණ්ඩාර කුමරා පළමුවන විමලධර්ම සූරිය නමින් රජ විය. ( )

08 පුනරුද සමයේ යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට මාර්ටින් ලූතර් පියතුමා මුල් විය. ( )

09 හින්දු බලපෑම මත සඳකඩ පහණින් වෘෂභ රූපය ඉවත් වූයේ අනුරාධපුර යුගයේ දීය. ( )

10 මහකනදරා වැව ධාතුසේන රජු විසින් කරවන ලද්දකි. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා තිත් ඉර මත ලියන්න.**

11 I වන රාජසිංහ රජතුමා I වන විමලධර්මසූරිය රජු හමුවේ පරාජිතව ............................................ උයනේ දී උණ කටුවක් ඇනීමෙන් ජීවිතක්ෂයට පත් විය.

12 රජරට ශිෂ්ටාචාරයට අයත් කලාත්මක ම බෝධිසරය ............................................ බෝධිසරයයි.

13 උඩරට නායක්කාර වංශික රජවරු අතර ප්‍රථමයා ............................................ රජතුමාය.

14 වාර්ෂික දළදා පෙරහැර පැවැත්වීමට ............................................ රජතුමා කටයුතු කළේය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

15 යුරෝපා වෙළඳුන් භාණ්ඩ ලබාගත් ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය ........................................................ නගරයේ පිහිටා ඇත.

(කීර්ති ශ්‍රී රාජසිංහ, පොළොන්නරුව, පෙතන්ගොඩ, නිල්ලක්කම, කොන්ස්තන්තීනෝපල්, ලිස්බන්, ශ්‍රී විජය රාජසිංහ)

- **අංක 16 - 20 දක්වා 'A' තීරුවේ සඳහන් තොරතුරු හා සම්බන්ධ පිළිතුර 'B' තීරුවෙන් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16

| A | B |
|---|---|
| 1. හුරුළු වැව | A - ධාතුසේන රජු |
| 2. කලා වැව | B - පණ්ඩුකාභය රජු |
| 3. තිසා වැව | C - මහසෙන් රජු |
| 4. බසවක්කුලම වැව | D - දේවානම්පියතිස්ස රජු |

(i) ABCD (ii) CBAD (iii) CADB (iv) DCBA

17

| A | B |
|---|---|
| 1. කුසුමාසන දේවිය | A - මහා අස්ථාන |
| 2. දෙවන රාජසිංහ රජු | B - දොන් ජුවන් |
| 3. යමසිංහ බණ්ඩාර | C - දෝන කතිරිනා |
| 4. කොනප්පු බණ්ඩාර | D - දොන් පිලිප් |

(i) ABCD (ii) BACD (iii) CBAD (iv) CADB

18

| A | B |
|---|---|
| 1. වසභ රජු | A - මිනිපේ ඇළ |
| 2. මහසෙන් රජු | B - ඇලහැර ඇළ |
| 3. ධාතුසේන රජු | C - තල්වතු ඇළ |
| 4. පළමු අග්ගබෝධි රජු | D - යෝධ ඇළ |

(i) ABCD (ii) BCDA (iii) BDAC (iv) DCBA

19

| A | B |
|---|---|
| 1. පෘථිවිය ගෝලාකාර බව සොයා ගැනීම | A - ජොහැන්නස් කෙප්ලර් |
| 2. ග්‍රහලෝක ඉලිප්සාකාරව සූර්යයා වටා ගමන් කිරීම | B - විලියම් හාවේ |
| 3. දුරේක්ෂය මගින් ආකාශ වස්තු නිරීක්ෂණය | C - ගැලිලියෝ ගැලිලි |
| 4. රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු සොයා ගැනීම | D - නිකලස් කොපර්නිකස් |

(i) ABCD (ii) DACB (iii) BCAD (iv) ACDB

20

| A | B |
|---|---|
| 1. බර්තොලමියු ඩයස් | A - මෙක්ෂිකෝව |
| 2. ක්‍රිස්ටෝපර් කොලම්බස් | B - කුණාටු තුඩුව |
| 3. පර්ඩිනන්ඩ් මැගලන් | C - පිලිපීන් දූපත් |
| 4. ෆර්ඩිනැන්ඩෝ කෝටේස් | D - කැරිබියන් දූපත් |

(i) ABCD (ii) CBDA (iii) BDCA (iv) DCBA

(ල. 02 × 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**08 ශ්‍රේණිය** **ඉතිහාසය - II කොටස**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (අ) (i) පින්තූරයේ දැක්වෙන සිතුවම කුමක් ද?

(ii) මෙම සිතුවම නිර්මාණය කළ තැනැත්තා කවුද?

(iii) ඔහු කුමන ජාතිකයෙක් ද?

(iv) මෙතුමාගේ තවත් විශිෂ්ට නිර්මාණයක් නම් කරන්න (ල. 04)



(ආ) (i) මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙම ගොඩනැගිල්ල අයත් යුගය දක්වන්න.

(iii) මෙය නිර්මාණය කිරීම සඳහා භාවිතා කර ඇති ද්‍රව්‍ය කුමක් ද?

(iv) මෙම නිර්මාණය සකස් කර ඇති ශෛලිය දක්වන්න. (ල. 04)



(ඇ) මෙම පින්තූරයේ දැක්වෙන්නේ උඩරට රාජ්‍යයේ සිටි පාලකයෙකි.

(i) මෙතුමාගේ නම කුමක් ද?

(ii) මෙම රජතුමා කුමන ආගම් භක්තිකයෙක් ද?

(iii) මෙතුමාට බෞද්ධ ආගම පිළිබඳ දැනුමක් ලබා දුන් භික්ෂූන් වහන්සේ නම් කරන්න.

(iv) මොහු ලන්දේසින් පලවා හැරීමට මහනුවරට ගෙන්වා ගත් ඉංග්‍රීසි දූතයා කවුද? (ල. 04)



(ඈ) දී ඇති ලංකා සිතියම අධ්‍යයනය කර පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


(i) A අක්ෂරයෙන් දැක්වෙන්නේ දළදා මාලිගාව පිහිටා ඇති නගරයයි. එය නම් කරන්න.

(ii) B අක්ෂරයෙන් දැක්වෙන්නේ ලංකාවට පෘතුගීසින් පැමිණෙන විට අටවන වීර පරාක්‍රමබාහු පාලනය කළ රාජධානියයි. එය නම් කරන්න.

(iii) C අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න.

(iv) පෘතුගීසින් විසින් ඉදිකරන ලද මඩමක් පිහිටි ස්ථානයක් D අක්ෂරයෙන් දැක්වේ. එය නම් කරන්න. (ල. 04)

(ල. 16)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02. (i) පහත සඳහන් කර්මාන්තවල කියැවුණු පුද්ගලයන් හැඳින්වූ නම කුමක් ද?


A - ලෝහ වැඩ කරන්නා ..............................................................

B - තඹ වැඩවල නිරත වන්නා ..............................................................

C - බෙලෙක් වැඩ කරන්නා .............................................................. (ල. 03)

(ii) අතීතයේ උළු නිෂ්පාදනය කළ ආකාරය මූලික අදියර හතරකින් දක්වන්න. (ල. 04)

(iii) හිස්තැනට අදාළ පිළිතුර ලියන්න.




(ල. 04)

03. (i) මහනුවර රාජධානිය හඳුන්වන වෙනත් නම් තුනක් දක්වන්න. (ල. 03)

(ii) පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයන් වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

A - උඩරට රාජධානියේ මුල්ම රජතුමා ..............................................................

B - ඌව ප්‍රදේශය ආක්‍රමණය කළ පෘතුගීසි ජාතිකයා ..............................................................

C - ලංකාවේ සියම් නිකාය ආරම්භ කිරීමට මුල් වූ රජතුමා ..............................................................

D - උඩරට ගිවිසුමට සම්බන්ධ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ..............................................................

(දෙවන රාජසිංහ, සේනා සම්මත වික්‍රමබාහු, රොබට් බ්‍රවුන්රිග්, කීර්ති ශ්‍රී රාජසිංහ, කොන්ස්තන්තීනු ද සා, ෆෙඩ්රික් නෝර්ත්, රාජාධිරාජසිංහ) (ල. 04)

(iii) මහනුවර රාජධානි සමයේ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පැවති ලක්ෂණ හතරක් දක්වන්න. (ල. 04)

04. (i) පුනරුද සමයේ බිහි වූ පහත විශ්ව විද්‍යාල ඉදි වූ රට නම් කරන්න.

A - බොලොඤ්ඤා

B - ඔක්ස්ෆර්ඩ්

C - පැරිස් (ල. 03)

(ii) (අ) ඉතාලිය හා ප්‍රංශය මව්බිම කරගත් පුනරුද සමයේ බිහිවූ ගත්කතුවරු දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)

(ආ) මයිකල් ආංජිලෝ අග්‍රගන්‍ය මූර්ති ශිල්පියාගේ විශිෂ්ට නිර්මාණ දෙකක් දක්වන්න. (ල. 02)

(iii) පුනරුද සමයේ බිහි වූ කලාශිල්පවල සුවිශේෂී ලක්ෂණ හතරක් දක්වන්න. (ල. 04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05. (i) යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු තුනක් දක්වන්න. (ල. 03)

(ii) පහත දැක්වෙන ලෝක සිතියමේ දක්වා ඇති A B C D අක්ෂර වලට අදාල ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. සිතියමේ A අක්ෂරයෙන් දක්වා ඇත්තේ පෙර අපර දෙදිග වෙළඳාමට සම්බන්ධ වූ මුහුදකි. එය කුමක් ද?

02. B අක්ෂරයෙන් දැක්වෙන්නේ ඉන්දියන් සාගරයේ පිහිටි වැදගත් බොක්කකි. එය නම් කරන්න.

03. මුස්ලිම් බලය ව්‍යාප්ත වූ මැද පෙරදිග රටක් C අක්ෂරයෙන් දැක්වේ. එය නම් කරන්න.

04. D අක්ෂරයෙන් දැක්වෙන්නේ වස්කෝද ගාමා ප්‍රථමයෙන්ම ආසියාවට පැමිණි රටයි. එය කුමක් ද?

(ල. 04)




(iii) A - දේශ ගවේශනය සඳහා අනුග්‍රහ දැක්වූ ප්‍රධාන රටවල් දෙකක් දක්වන්න. (ල. 02)

B - නාවික හෙන්රි ආරම්භ කළ නාවික අභ්‍යාස විද්‍යාලයේ ඉගැන්වූ විෂයයන් දෙකක් දක්වන්න.

(ල. 02)

06. (i) විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය බෙදීගිය කොටස් තුන නම් කරන්න. (ල. 03)

(ii) පෘතුගීසි පාලන කාලයේ ලංකාවට පැමිණි මිෂනාරිවරු කටයුතු කළ ආකාරය පිළිබඳ පහත වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රදේශය | මිෂනාරිවරු |
|---|---|
| 1. ........................................ | ප්‍රැන්සිස්කන් වරු |
| 2. සතර කෝරලය | ........................................ |
| 3. ........................................ | ජේසුයිට්වරු |
| 4. සබරගමුව | ........................................ |


(ල. 04)

(iii) A - පෘතුගීසින්ගේ ආර්ථික කටයුතු සිදු වූ ප්‍රධාන අංශ දෙක දක්වන්න. (ල. 02)

B - පෘතුගිසින්ගෙන් මෙරට සංස්කෘතියට එකතු වූ නව අංග දෙකක් දක්වන්න. (ල. 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

07. (i) පහත උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




(ල. 07)

හරහට

1. පෘතුගීසින් ලංකාව මේ නමින් හැඳින්වීය
2. බ්‍රිතාන්‍යයන්ට යටත් විජිතයක් වූ රටකි.
3. පෘතුගිසි නමක් ලැබුණ ඇඳුමකි

පහළට

1. පෘතුගීසින් පලවා හැරීමට සිංහල රජවරු උදව් ලබා ගත් යුරෝපා ජාතියකි
2. යුරෝපීය උගතුන් මෙම විෂය ගැඹුරින් හැදෑරීය
3. ප්‍රංශ ජාතිකයෝ ඉන්දියාවේ මේ ප්‍රදේශයේ වෙළඳ ගබඩාවක් පිහිටුවා ගත්තේය.
4. පෘතුගීසින් පැමිණි අවධියේ පරරාජසේකම් රජතුමා මේ රාජධානිය පාලනය කළේය.

(ii) ලාංකික ජනතාව කතෝලික ආගමට හරවා ගැනීම සඳහා පෘතුගීසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග හතරක් දක්වන්න. (ල. 04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

01. (ii) 02. (i) 03. (iii) 04. (iv) 05.(iii) 06. (✓) 07. (✓) 08. (✓) 09. (✗) 10. (✗)
11. පෙතන්ගොඩ 12. නිල්ලක්කම 13. ශ්‍රී විජය රාජසිංහ 14. කීර්ති ශ්‍රී රාජසිංහ 15. කොන්ස්තන්ති නෝපල
16. (iii) 17. (iv) 18. (ii) 19. (ii) 20. (iii) (2 x 20 = ල. 40)

## II කොටස

01. (අ) (i) අන්තිම රාත්‍රී භෝජනය (ii) ලියනාඩෝ ඩාවින්චි
(iii) ඉතාලි ජාතිකයෙකි (iv) මොනාලිසා (ල. 04)
(ආ) (i) II ශිව දේවාලය (ii) පොලොන්නරුව (iii) ගල් (iv) චෝල වාස්තු විද්‍යා ශෛලිය (ල. 04)
(ඇ) (i) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ii) හින්දු (iii) වැලිවිට සරණංකර සංඝරාජ හිමි
(iv) ජෝන් ෆයිබස් (ල. 04)
(ඈ) (i) මහනුවර (ii) කෝට්ටේ (iii) මහවැලි ගඟ (iv) යාපනය (ල. 04) (ල. 16)

02. (i) A - කබර, කම්මාර B - තඹර C - තොපෂ (ල. 03)
(ii) A - සුදුසු මැටි වර්ග තෝරාගෙන පදම් කිරීම, B - උළු අච්චුවේ යොදා හැඩය සකසා ගැනීම
C - උළු වියළීම D - පිළිස්සීම (ල. 04)
(iii) 1 - අනුරාධපුර 2. - මහා පරාක්‍රම බාහු රජු 3. - වළගම්බා රජු
4. - ථූපාරාමය

03. (i) සෙංකඩගලපුරය, කන්ද උඩරට - උඩරට රාජධානිය, කන්දෙ නුවර (ල. 03)
(ii) A - සේනාසම්මත වික්‍රමබාහු B - කොන්ස්තන්තීනු ද සා
C - කීර්ති ශ්‍රී රාජසිංහ D - රොබට් බ්‍රවුන්රිග් (ල. 03)
(iii) හෙල්මළු ක්‍රමයට වී වගා කිරීම, කුඹුරු ගොවිතැනට අමතරව හේන් වගා කිරීම, ගෙවතු වගාව (කොස් , දෙල්, ගම්මිරිස්) සත්ව පාලනය (ල. 04)

04. (i) A - ඉතාලිය B - එංගලන්තය C - ප්‍රංශය (ල. 03)
(ii) (අ) ඉතාලිය - ඩාන්ටේ ප්‍රංශය - ඉරාස්මස් (ල. 02)
(ආ) පියෙටා ප්‍රතිමාව, ඩේවිඩ්ගේ ප්‍රතිමාව, මෝසෙස්ගේ ප්‍රතිමාව (ල. 02)
(iii) ලෞකිකත්වයට මුල් තැන ලබා දීම, ධනවත් පවුල්වල අය වස්තු විෂය කර ගැනීම, නිර්මාණ කර්තෘන්ගේ නමින් එළි දැක්විම, ධනවතුන් අනුග්‍රහය දැක්වීම, මූලික පරමාර්ථය රස වින්දනය ආදි (47 පිටුව) (ල. 03)

05. (i) ආසියාවේ වෙළඳ ද්‍රව්‍ය ලබාගෙන යුරෝපයට ගෙන ගොස් අලෙවි කර ආර්ථික වාසි ලැබීම, මුස්ලිම්වරුන් සතු ආසියාවේ වෙළඳ ඒකාධිකාරිය යුරෝපීයන් ලබා ගැනීම, ආසියාතික රටවල කතෝලික ධර්මය පැතිරවීම. (ල. 03)
(ii) A - මධ්‍යධරණී මුහුද B - බෙංගාල බොක්ක C - අරාබිය D - ඉන්දියාව (ල. 04)
(iii) A - පෘතුගාලය, ස්පාඤ්ඤය, එංගලන්තය (ල. 02)
B - නාවික ශිල්පය, නැව් තැනවීම, සිතියම් ඇඳීම, තාරකා ශාස්ත්‍රය (ල. 02)

06. (i) 1. කෝට්ටේ, රයිගම, සීතාවක (ල. 03)
(ii) 1. මාතර, 2. ඔගස්ටීනියන්වරු 3. සත් කෝරළය 4. ඩොමිනිකන්වරු (ල. 04)
(iii) A - ආදායම් රැස්කිරීම, වෙළඳ ද්‍රව්‍ය පිටරට යැවීම (ල. 02)
B - පෙළපත් නාම, ආහාර, ඇඳුම්, කලාව, සංගීතය (ල. 02)

07. (i) හරහට
1. සෙයිලන්
2. ඉන්දියාව
3. කම්ස
පහළට
1. ලන්දේසින්
2. ඉතිහාසය
3. කරිකාල්
4. යාපනය (ල. 07)
(ii) කතෝලික ආගම වැළඳගත් අයට රජයේ තනතුරු, වරප්‍රසාද ලබා දීම, බදු වලින් නිදහස් කිරීම, අධ්‍යාපනය ලබා දීම, සුභ සාධන කටයුතු ලබා දීම, උත්සව, පෙරහර පැවැත්වීම. (ල. 04)